## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6.1 (ආ) හි නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද අනෙකුත් නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** මූල්‍ය ප්‍රකාශන

**1.6.1** ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් මිලදී ගත් වර්ෂය සඳහා ක්ෂය නොකළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් ස්ථාවර වත්කම් සඳහා රු.4,552,630ක් ක්ෂය කර තිබුණි. | 2023 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2020 හා 2021 වර්ෂවල මිලදී ගෙන තිබුණු රු.1,650,947 ක් වු පුස්තකාල පොත් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු.1,997,392 ක් වු පුස්තකාල පොත් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත නොකර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ පූර්ව කාල පරිච්ඡේදවල වැරදි ලෙස රු.86,578,638 ක් හර කර තිබුණද ජ'නල් වවුචර් වලින් හර කර තිබු වටිනාකම රු.84,573,045 ක් වුයෙන් රු.2,005,593 කින් අරම්භක ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට අනුව වර්ෂයේ විස්තීර්ණ ආදායම රු.972,493,885 ක් වුවද එම ශේෂය ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශයේ රු.976,156,225 ක් ලෙස රු.3,662,340 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඇතුළත් වී ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් නොමැති වුවද ඒ යටතේ රු. 1,032,445 ක් දක්වා තිබුණි. | මේ පිළිබඳව තොරතුරු ලබා ගැනීමට ප්‍රධාන නාගරික ඉංජිනේරු වෙත ලිපියක් යොමු කර ඇති බව. | ශේෂයන් කුමක්ද යන්න හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | බේලින් යන්ත්‍රයක් මිලට ගැනීම සඳහා කටයුතු කර නොතිබුණද ඒ වෙනුවෙන් රු.1,500,000 ක් ණය හිමි වෙන් කිරීම නිසා වියදම් ගිණුම් හා ණය හිමි ගිණුම් වැඩියෙන් දක්වා තිබුණි. | අතපසු වීමකින් සටහන් වී ඇත. 2023 ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු විපී නාම පුවරු ගාස්තු ලෙස රු.1,500,000 ක් ගිණුම්ගත කර තිබුණ ද 2021 වර්ෂයේදී එම මුදල් සභාවට ලැබී තිබුණි. | ඉදිරියේදී නිවැරදිව පිළියෙල කරන බව. | -එම- |
| (එ) | වර්ෂය සඳහා අතිරික්තය තුළ පැවති රු.279,873,451 ක් වු ආයෝජන ආදායම මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වන මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ඉවත් කළ යුතු වුවත් එලෙස ගැලපුම් කර නොතිබුණි. | -එම- | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඒ) | කෙටි කාලීන ගෙවිය යුතු දෑ වල අඩු වීම වු රු.319,857,977 ක මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය අඩු වීම් කෙරෙහි බලපෑවද මුදල් ප්‍රවාහය පිළියෙල කිරීමේදී එම අගය එකතු කර තිබුණි. | -එම- | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමේ අගය වු රු.34,801,378 ක අගය ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ ගණනය කිරිමේදී රු.382,942,786 ක් ලෙස දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඕ) | ආදායම් සාරාංශයට අනුව සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.199,060,055 ක් වු ආයෝජන ආදායම ආයෝජන ක්‍රියාකාරකම් වලින් වු මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදී එකතු නොකිරීම නිසා ආයෝජන ක්‍රියාකාරකම් වලින් වු ශුද්ධ මුදල් ප්‍රවාහය එම අගයෙන් අඩු වී තිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 04 කට අදාළ ලෙජර ගිණුමේ ශේෂය හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර රු.31,290,635 ක වෙනසක් විය. | ඉදිරියේදී අදාළ නිවැරදි කිරීම් කරන බව. | වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසදීමේදී රු.14,213,887 ක වෙනසක් විය. | -එම- | මූල්‍ය ප්‍රකාශන වල ශේෂය හා උපයෝගි ලේඛනවල ශේෂ සසඳා නිවැරදි කිරීම් කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ලී බඩු උපකරණ, කර්යාලීය උපකරණ හා මෘදුකාංග වත්කම් ගිණුම්වල ආරම්භක ශේෂවලට හා සමුච්චිත ක්ෂය ගිණුමට රු.11,016,840 ක් ගැලපීම් කර තිබූ අතර එම ගැලපීම් සම්බන්ධ විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | කිසිදු මූලාශ ලේඛනයක් පරිශීලනයෙන් තොරව සිදු කර ඇත. ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම් වලට අදාළව සිදු කරන ගැලපීම් වලට තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | උපලේඛන ඉදිරිපත් නොකිරිම හේතුවෙන් ගිණුම් විෂයයන් 05 ක රු.24,355,985 ක් වූ වටිනාකම සම්බන්ධයෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරියේදී මේ සම්බන්ධව තොරතුරු සොයා කටයුතු කරන බව. | උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

**නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.**

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත (252 අධිකාරය) | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 218 වගන්තිය | නගරාධිපතිවරයා විසින් සභාවේ ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශයක්ද ඇතුළත්ව සභාවේ පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් පිළියෙල කර සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට සකසමින් පවතින අතර ඉතා කඩිනමින් නිම කර ඉදිරිපත් කරන බව. | පරිපාලන වාර්තාව පිළියෙල කළ යුතුය. |
| (ii) | 266 (අ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව වෙළඳබලපත්‍ර, කර්මාන්ත හා ව්‍යාපාර බදු, දැන්වීම් පුවරු ගාස්තු හා වාහන නැවතුම්පල ගාස්තු යන ආදායම් ශීර්ෂ 04 කට අදාළව රු.2,760,440 ක හිඟ ආදායම් කපා හැර තිබුණි. | සභා අනුමැතිය ලබා ගැනීමෙන් සිදුකර ඇති බව. | අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග | | | |
| (i) | 12 (xii) වන නියෝගය | සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | සිව් අවුරුදු සැලැස්ම පිළියෙල කර නොමැති බව. | සිව් අවුරුදු සංවර්ධන සැලැස්ම පිළියෙල කළ යුතුය. |
| (ii) | 42 හා 44 වන නියෝගය | දේපළ සමීක්ෂණයක් සිදු කර එම වාර්තා වල පිටපතක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නගර සභාව සතු දේපළ පිළිබඳව සමීක්ෂණයක් සිදු කරන ලදී. දේපළවල නෛතික භාවය තහවුරු කර ගැනීමෙන් පසු මැනුම් කටයුතු සිදුකර සත්‍ය වර්ග ප්‍රමාණයන් හඳුනාගෙන වාර්තාවක් සකසා කඩිනමින් විගණකාධිපති වෙත යොමු කරන බව. | දේපළ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (iii) | 274 වන නියෝගය | සේවා කාර්යසාධන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | එම වාර්තා කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කරන බව. | සේවා කාර්ය සාධන වාර්තා පිළියෙල කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - | | | |
| (i) | මු.රෙ.371 (5) | අවස්ථා 08 කදී ලබා දුන් රු.176,130 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා මාස 05 සිට මාස 09 ක කාලයක් ගත වී තිබුණි. | මින් ඉදිරියට අත්තිකාරම් ලබා දීමෙන් පසු කාර්යය අවසන් කළ වහාම එම අත්තිකාරම් පියවීමට සුදුසු වැඩ පිළිවෙලක් යොදන බව වාර්තා කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 571 | වසර 02 ක ඉක්මවූ රු.4,532,497 ක මල ප්‍රවාහන තැන්පතු නියාදනය කර නොතිබුණි. | මෙම මල ප්‍රවාහන තැන්පත් ගෙවීම් ප්‍රමාද වී තිබුණේ අප සේවාදායකයින්ගෙන් VAT බදු අය නොකරන ලද අතර ජලා ප්‍රවාහන මණ්ඩලය අපෙන් VAT බදු අය කිරීම නිසා VAT බදු ගෙවීම පිළිබඳ තීරණයක් ගැනීම ප්‍රමාද වූ නිසා බව. | -එම- |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.976,156,225 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.12,820,661 ක් විය.

**2.2** මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ මැයි හා ජුනි මාසවල වැටුප් ගෙවීම සඳහා පිළිවෙලින් 2022 මැයි 24 දින රු.30,000,000 ක් හා 2022 ජුනි 23 දින රු.40,000,000 ක් වූ ස්ථාවර තැන්පතු කල් පිරිමට පෙර අවලංගු කර මුදල් ලබා ගෙන තිබුණි. මෙසේ කල් පිරිමට පෙර ස්ථාවර තැන්පතු අවලංගු කිරීම නිසා රු.2,675,345 ක පොලී ආදායමක් සභාවට | අප විසින් බැංකුවට වැටුප් ගෙවීම් කරන්නේ Slip ක්‍රමය හරහාය එහිදී නියමිත දිනට වැටුප් සේවකයින්ගේ ගිණුම් වලට බැර වීම සඳහා ඊට පෙර දින Slip මඟින් යැවීම අනිවාර්ය වේ. යම් පොලියක් සභාවට අහිමි වී තිබුණද වැටුප් ගෙවීම කිසිසේත් | වැටුප් ගෙවීමට නියමිත දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මුදල් ලැබී ඇත. සභාවට පාඩුවක් සිදු නොවන පරිදි තිරණ |

| | | | |
|---|---|---|---|
| | අහිමි වී තිබුණි. තවද වැටුප් ගෙවීමට නියමිත වූ දින පළාත් පලාන දෙපාර්තමේන්තුවෙන් මුදල් ලැබී තිබුණු අතර සභාව විසින් වැටුප් ගෙවීමට නියමිත වූ දිනට පෙර දින වැටුප් ගෙවීම හේතුවෙන් මෙසේ ස්ථාවර තැන්පතු අවලංගු කිරීමට හේතු වී තිබුණි. | ප්‍රමාද කළ නොහැකි ගෙවීමක් නිසා එම අවස්ථාවේදී ගත හැකි ප්‍රශස්ත තීරණ ගෙන ඇත. අප විසින් වාර්ෂිකව ස්ථාවර තැන්පත් ආයෝජනයෙන් එකතු කර දී ඇති විශාල ආදායම හා සැසඳීමේද මෙහි අහිමි වී ඇති පොලී ආදායම ඉතා අඩු අගයක් බව. | ගෙන කටයුතු කළ යුතුය. |
| (ආ) | 2022 අප්‍රේල් 20 දින මහජන බැංකුවේ ආයෝජනය කර තිබූ රු. මිලියන 500 ක් වටිනා ස්ථාවර තැන්පතු 51 ක් උපලබ්ධි කර එදිනම රු. මිලියන 600 ක මුදලක් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට චෙක්පතක් මඟින් ගෙවීම් කර තිබුණි. එහෙත් මෙම රු.මිලියන 600 ක මුදල 2022 අප්‍රේල් 26 දින රු.50,000,000 බැගින් වූ ස්ථාවර තැන්පතු 12 ක් වශයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ආයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 600 ක සභා අරමුදල් දින 06 ක් පොලී ඉපයීමෙන් තොරව බැංකුවක රඳවා තැබීමෙන් සභා අරමුදලට පාඩුවක් සිදුව තිබුණි. | මෙම රු.මිලියන 600 ක මුදල ජාතික ඉතිරි කිරීමේ ස්ථාවර තැන්පත් ගිණුමේ දැමීමට අපේක්ෂා කලේ තරගකාරි රාජ්‍ය බැංකු අතරින් වැඩිම පොලී ප්‍රතිශතය ඔවුන් ප්‍රදානය කිරීමට එකඟ වූ නිසාය. මෙහිදී දින 06 ක පොලී ආදායමක් අහිමි වුවද එම අහිමි වූ ආදායමට වඩා ඉතා විශාල මුදලක් ඉහල පොලියක් යටතේ ආයෝජනය කිරීමෙන් ලබා ගත හැකි බව. | මුදල් නිෂ්කාර්යව නොතබා ආයෝජනය කර පොලී ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ. 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැ. 31 දිනට මුළු හිඟය |
| | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 | (රු.) '000 |
| වරිපනම් හා බදු | 430,000 | 409,571 | 347,132 | 630,171 | 420,000 | 387,752 | 339,513 | 483,881 |
| කුලී | 27,982 | 16,222 | 20,687 | 20,107 | 16,500 | 4,880 | 12,226 | 6,959 |
| බලපත්‍ර ගාස්තු | 9,435 | 5,000 | 3,915 | 5,130 | 22,250 | 21,844 | 14,558 | 100,430 |
| වෙනත් ආදායම් | 532,788 | 926,392 | 923,032 | 936,406 | 525,900 | 15,457 | 276,022 | 16,842 |
| එකතුව | 1,000,205 | 1,357,185 | 1,294,766 | 1,591,814 | 984,650 | 429,933 | 642,319 | 608,112 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කරන ලද වරිපනම් බදු ආදායම රු. 388,176,867 ක් වුවද ඉන් රු.164,669,497 ක් හෙවත් සියයට හතලිස් දෙක (42%) ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | මෙම මුදල් ඇති වී තිබෙන්නේ අධි බිල් කිරීමක් සිදු වී ඇති නිසාවෙනි. 2023 මාර්තු 31 දින වන විට හිඟයෙන් රු.50,928,302 ක් අය කර ගෙන ඇති බව. | පනතේ විධිවිධාන අනුව හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මාසික ආදායම් හා හිඟ වාර්තා අනුව පසුගිය වර්ෂයේ හිඟ වරිපනම් ශේෂය රු. 483,885,527 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළ දී රු.106,083,319 ක් අය කර ගෙන තිබූ අතර රු.377,802,208 ක් හෙවත් සියයට හැත්තෑ අට (78%) ක් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අධිබිල් කිරීම හා පසුගිය කාලයේ රටේ පැවති ආර්ථික අර්බුදය හා කොරෝනා වසංගතය නිසා දේපළ තහනම් නොකිරීම මත හිඟය වැඩි වී ඇති බව. | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | 2022 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු අය කළ හැකි දේපළ 87749 ක් පැවති අතර ඉන් දේපළ 44650 ක රු.532,240,119 ක වරිපනම් හිඟයක් පැවතුණි. මෙම හිඟය තුළ රු.50,000 ත් රු.100,000 ත් අතර වටිනාකමකින් යුත් දේපළ 870 කින් රු.61,214,326 ක් ද රු.100,000 ට වැඩි වටිනාකමකින් යුතු වරිපනම් ඒකක 729 කින් රු.252,739,249 ක් ද අයවීමට තිබුණි. | රු.50,000 ට හා රු.100,000 ට වැඩි දේපළ සඳහා අධි බිල් වීම සිදු වී ඇති ප්‍රමාණය හඳුනාගෙන මේ වන විට වාර්තාවක් සකස් කරමින් පවතී. අධි තක්සේරු මුදල නිවැරදිව ගණනය කර කළමනාකරණ කමිටුවට යොමු කර කපාහැරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ව්‍යාපාර හා කර්මාන්ත බදු | | |
| (i) | සමාලෝචිත වර්ෂයට අදාළව කර්මාන්ත බද්ද හා ව්‍යාපාර බද්ද යටතේ පවතින දේපළ පිළිබඳ | අවසන් වරට සමීක්ෂණ සිදු කර ඇත්තේ 2018/ 2019 කාල සීමාව තුළදීය. දේපළ 8000 ක් පමණ | නියෝග අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | පවති. ආදායම් පරික්ෂකවරුන්ගේ හිඟයක් සභාව තුළ ඇති බැවින් මෙම සමීක්ෂණය වාර්ෂිකව සිදු කිරීම අපහසුය. 2023 වර්ෂයේ සිට මෙම සමීක්ෂණ ආරම්භ කර ඇති බව. | |
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.95,006,513 ක හිඟ ව්‍යාපාර හා කර්මාන්ත බදු ශේෂයෙන් රු.11,894,581 ක් හෙවත් සියයට දහතුන (13%) ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අය කර ගෙන තිබුණි. | මෙම තත්ත්වය ඇති වී තිබෙන්නේ අඩි බිල් කිරීම හේතුවෙනි. අඩි බිල් කිරීම පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව. | හිඟ බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කසළ බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ කසළ බදු ආදායම රු.14,560,240 ක් පැවතුණි. | මෙම හිඟ මුදලින් 2023 මාර්තු 31 දින වන විට රු.2,597,457 ක් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | වෙනත් බදු | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කේබල් ටී.වී ආදායම රු.4,433,435 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම හිඟ මුදල් අය කර ගැනීම් සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම අපහසු බව නීති නිලධාරි දන්වන ලදී. ඒ අනුව හිඟ මුදල් කපා හැරිම සඳහා කටයුතු කරමින් පවතින බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කඩකුලී | | |
| (i) | 2021 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කඩ කුලී ශේෂය වූ රු.18,429,725 කින් රු.12,983,389 ක් හෙවත් සියයට හැත්තෑව (70%) ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | කපා හැරීමට හෝ කඩ මුද්‍රා තැබීමට හෝ අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාළ හිඟ කඩ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | දිර්ඝ කාලයක සිට හිඟ කුලියක් පැවති කඩ කාමර 60 ක් මුද්‍රා තබා පැවති අතර එම කඩ කාමරවලින් අය විය යුතු හිඟ කුලිය රු.2.203,484 ක් විය. එම කඩ කාමරවලින් අය කර ගත යුතු හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කර | මින් සමහරක් කඩ ටෙන්ඩර් කර ලබා දී ඇත. සමහර කඩ අබලි වී ඇති බව | කඩ වෙනත් පාර්ශවයන් වෙත පැවරිමට හා හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණ අතර එම කඩ කාමර පවරා ගෙන වෙනත් පාර්ශවයන් වෙත බදු දීමට ද කටයුතු කර නොතිබුණි. | | |
| **(ඊ)** | දේපල කුලී (බදුකර) | | |
| | **2021** දෙසැම්බර් **31** දිනට පැවති හිඟ කුලී ශේෂය වූ රු.**6,482,383** කින් රු.**5,889,644** ක් හෙවත් සියයට අනූඑක **(91%)** ක් වර්ෂය අවසන් වන විටත් අය කර ගෙන නොතිබුණි. | **2023** වර්ෂයේ ගිවිසුම් අත්සන් කළ පසු අයවීම් වල සැලකිය යුතු ප්‍රතිශතයක් එකතු කර ගැනීමට අපේක්ෂා කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(උ)** | වෙළඳ බලපත්‍ර ගාස්තු | | |
| **(i)** | සමාලෝචිත වර්ෂය සඳහා බිල් කළ වෙළඳ බලපත්‍ර ආදායම රු.**9,435,000** ක් වූ අතර රැස් කළ ආදායම රු.**3,914,569** ක් විය. එය බිල් කළ ආදායමෙන් සියයට හතළිස් එක **(41%)** ක් පමණක් විය. | කොවිඩ් හා රටේ පවතින ආර්ථික තත්වය අනුව **2022.12.31** දින දක්වා වෙළඳ බලපත්‍ර නිකුත් කිරිම සිදු විය. ඒ අනුව මෙසේ හිඟයක් පැවතිමට හේතු වූ බව. | හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| **(ii)** | සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කළ යුතු වෙළඳසැල් **1887** ක් පවතින බව දක්වා තිබුණ ද වෙළඳසැල් **577** ක් සඳහා පමණක් බලපත්‍ර නිකුත් කර තිබු අතර වෙළඳසැල් **1310** ක් බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු සිදු කර තිබුණි. | දැනට ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යන හා නොකරන ආයතන සම්බන්ධයෙන් දැනට කරගෙන යන සමීක්ෂණය අනුව ව්‍යාපාර බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාරික කටයුතු කරගෙන යන ආයතන හඳුනා ගැනීමට හැකි බව. | බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |
| **(ඌ)** | දැන්වීම් පුවරු ආදායම | | |
| | සමාලෝචිත වර්ෂයේ අයවිය යුතු ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු රු.**18,129,643** ක් වූ අතර **2019**, **2020** හා **2021** යන වර්ෂ සඳහා පිළිවෙලින් රු.**5,548,550** ක්, රු.**7,648,100** ක් හා රු.**4,732,858** ක් විය. ඒ අනුව වර්ෂ **02** ඉක්මවූ ලැබිය යුතු හිඟ ආදායම රු.**13,196,650** ක් විය. | ආදායම් පරීක්ෂක තනතුරු හිඟය නිසා සමීක්ෂණයක් අවසන් වරට කර ඇත්තේ **2017** වර්ෂයේ වන අතර සභා තීරණයක් ගෙන එය කළේද විශ්ව විද්‍යාල සිසුන් විසිනි. එහි බොහෝ අඩුපාඩු පැවතිනි. මේ නිසා අධිගණනය වීමක් සිදුව ඇත. නිවැරදි දත්ත හඳුනාගෙන අධිගණනය වී ඇති මුදල නිරවුල් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර හිඟ ආදායම් අයකර ගත යුතුය. |

(එ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගේ සහ අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.24,235,150 ක් හා මුද්දර ගාස්තු රු.884,997,614 ක් විය. | උසාවි දඩ මුදලින් රු.4,565,499 ක් ගංගොඩවිල උසාවියට භාර දී ඇත ගල්කිස්ස උසාවියට අදාළ රු.2,434,567 ක් පළාත් ආදායම් දෙපාර්තුමේන්තුවට භාර දී ඇත. 2019 අප්‍රේල් - දෙසැම්බර් උපලේඛන සකස් කරමින් පවති. මුද්දර ගාස්තු හිඟ මුදලින් 2023 වර්ෂයේදී රු.512,746,370 ක් ලැබී ඇත. | නිසි කාල වකවානුව තුළ ලැබිය යුතු මුදල් ගණනය කර ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

**2.4** අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් 1974 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළදී පැනවූ අධිභාර වෙනුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.2,340,379 ක් අයකර ගැනීමට තිබුණි. | අදාළ මුදල් අය කර ගැනිමට කටයුතු කරන බව. | අධිභාර මුදල් අයකර ගත යුතුය. |

**3** මෙහෙයුම් සමාලෝචනය

**3.1** පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉදුල් කසළ බැහැර කිරීම | | |
| (i) | කරදියාන කසළ අංගනයේ ඉදුල් කසළ බැහැර කිරීමේ ගාස්තු 2021 අගෝස්තු 01 දින සිට මෙට්‍රික් ටොන් 01 ක් සඳහා රු.250 සිට රු.1,000 දක්වා ඉහළ ගොස් තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී කසළ ටොන් 15974 ක් බැහැර කිරීම සඳහා රු.15,974,110 ක් වියදම් දරා තිබුණි. | බල ප්‍රදේශයේ ජන ගහනය වැඩි වීමත් සමග ජනනය වන කසළ ප්‍රමාණය වැඩි වී ඇත. ටොන් 1 ක් සඳහා අය කිරීම ද රු.250 සිට රු.1000 ක් දක්වා වැඩි කර ඇති බව. | කසළ කළමනාකරණ වියදම් අඩු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | සභාවට දැරීමට සිදු වන පිරිවැය අවම කර ගැනීම සඳහාත් කසළ සම්පතක් ලෙස ප්‍රයෝජනයට ගැනීමත් සඳහා බල ප්‍රදේශයේ එකතු කරනු ලබන ඉදුල් කසළ සත්ව ආහාර ලෙස සහ කොම්පෝස්ට් ලෙස විකිණීම සඳහා රු.79,218 ක් වැය කර 2021 ඔක්තෝබර් 07 දින පුවත්පත් දැන්වීමක් පල කර 2021 ඔක්තෝබර් 27 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව 2021 දෙසැම්බර් 01 දින මහා සභාවේ සම්මත කර තිබුණද ටෙන්ඩර්කරුවන් සමඟ ගිවිසුම්ගත වී තිබුනේ 2023 මාර්තු 15 දිනය. | ටෙන්ඩර්කරු සමග ගිවිසුම්ගත වීමේදී ව්‍යාපාර ලියාපදිංචි වීමේ සහතික හා බැංකු ඇපකර ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. එක් ටෙන්ඩර්කරුවෙක් පමණක් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ අතර ඒ අනුව ඔහු සමග 2023.03.15 දින ගිවිසුම්ගත වූ බව. | කසළ තුලින් ආදායම් ඉපයීමට ප්‍රමාද නොකර කටයුතු කළ යුතුය. |
| (ආ) | නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරීම | | |
| | CFL බල්බ,ටෙම්පර්ඩ් ග්ලාස්, තහඩු, බෙල් කල මිශ්‍ර පොලිතින්, බේල් කල ඇලුමිනියම් දවටන, ඇලුමිනියම් ආහාර ඇසුරුම්, භාවිතා කරන ලද පැරණි ටයර්,රබර් ආශ්‍රිත නිෂ්පාදන, ගස් අතු කොටස් හා කඳන්,ලී යතු කොටස්, සියලුම වර්ගයේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, ඉවතලන දත් බුරුසු එකතු කිරීම හා බැහැර කිරීම පිළිබඳව ක්‍රමවේදයක් සභාව විසින් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | මිල ගණන් කැඳවූවද කිසිවෙක් මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි. නැවත 2023.04.06 දින මිල ගණන් කැඳවීමක් කළ ද එහිදීද කිසිදු ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් නොවූ බව. | නොදිරන අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව සතු දේපල සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් නිසි ආකෘතියට ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී. එම ලේඛනගත කිරීම් සිදු කිරීමෙන් පසු ප්‍රත්‍යාගණන කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රත්‍යාගණන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | 2019 නොවැම්බර් 18 දින සිදුකරන ලද මූල්‍ය වංචාවට අදාළ රු.145,496 ක පාඩුව එයට අදාළ වගකිව යුතු පාර්ශවය වෙතින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එය බැංකු සැසඳුමේ මුදල් අඩුවෙන් තැන්පත් කිරීම ලෙස දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් විනය නියෝග සභාවට ලැබී ඇති බැවින් එම නියෝග අනුව කටයුතු කර ගැටලුව අවසන් කළ හැකි බව. | අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කසළ ඉවත් කිරීමේ ගාස්තු නොගෙවීම හේතුවෙන් ටෙන්ඩර්කරු විසින් සභාවට එරෙහිව පවරා තිබූ නඩුව සඳහා **2012 ජූනි 15** දින ප්‍රකාශයට පත් කරන ලද බේරුම්කරණ ප්‍රදානයට අනුව රු.**20,958,779** ක් සහ වන්දිය ලෙස රු.**300,000** ක් වශයෙන් මුළු මුදල රු.**21,256,779** ක් බර්න්ස් ආයතනය වෙත සභාව විසින් ගෙවිය යුතු බවට තීරණය වී ඇත. එහි බේරුම්කරණ ප්‍රදානයට එරෙහිව සභාව විසින් මහාධිකරණයේ පැවරූ නඩුකරය නිෂ්ප්‍රභා වී තිබුණි. ඉහත තීරණ දෙකට විරුද්ධව සභාව විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ නඩුව **2021** දෙසැම්බර් **07** වන දින කැඳවූ අවස්ථාවේදී බර්න්ස් සමාගම රු.මිලියන **18** ක මුදලකට සමථයකට එළඹීමට සිය කැමැත්ත ප්‍රකාශ කර ඇත. නමුත් සභාව විසින් සිය මතය මෙතෙක් ප්‍රකාශ කර නොතිබුණි. | **2012** ප්‍රකාශයට පත් කරන ලද බේරුම්කරණ ප්‍රදානයට අනුව සභාව විසින් රු.**21,256,779** ක් බර්න්ස් ආයතනය වෙත ගෙවිය යුතු බවට තීරණය වී ඇත. බේරුම්කරණ ප්‍රදානයට එරෙහිව මහාධිකරණයේ පැවරූ නඩුවද නිෂ්ප්‍රභා විය. බර්න්ස් සමාගම රු.මිලියන **18** ක මුදලකට සමථ වීමට එකගතාවය පල කර ඇත. මෙම නඩුව **2023.07.06** දින නැවත කැඳවීමට නියමිත බව. | සභාවට වන පාඩුව අවම වන පරිදි කටයුතු කර සමථයකට පත් කර ගත යුතුය. |
| (ඈ) | ඉඩම්, ගොඩනැගිලි, මංමාවත්, බෝක්කු හා අනිකුත් යටිතල පහසුකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තොරතුරු ලබා දෙන ලෙස ප්‍රධාන නාගරික ඉංජිනේරුට දැනුම් දී ඇති අතර තොරතුරු ලැබීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ නොනිමි වැඩ ලෙස රු.**174,788,597** ක් දක්වා තිබුණු අතර ඉන් රු.**169,614,023** ක කොන්ත්‍රාත් කාර්යයන් **2017** සිට **2021** දක්වා වර්ෂවල පවරා තිබුණු අතර මෙම කොන්ත්‍රාත් කාර්යයන් නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | කිසියම් ව්‍යාපෘතියක් නිම නොකර පැහැර හරින අවස්ථාවකදී ඒ සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවේ. මෙහි ගෙවිය යුතු රැඳවුම්ද සඳහන් බව. | කොන්ත්‍රාත් නිම කරවා ගැනීමට හා ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ආරක්ෂක සේවා සැපයීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **2022/2024** වර්ෂ සඳහා ආරක්ෂක සේවා ලබා ගැනීමේදී නිත්‍යානුකූලව අවම මිල ඉදිරිපත් කළ ලංසු කරුට ලංසුව ප්‍රදානය නොකර **06** වන මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුට ලංසුව ප්‍රදානය කිරීම හේතුවෙන් සභා අරමුදලට මාසිකව රු.**96,600** ක අතිරේක වියදමක් දැරීමට සිදුව තිබුණි. | මෙම ගොනුව අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව භාරයේ ඇති නිසා පිළිතුරු සැපයීමට ගොනුව අවශ්‍යවේ. ඒ පිළිබඳ ලිපියක් ගොනු කර ඇති බව. | සභාවට පාඩුවක් නොවන පරිදි පවතින නීති රීති අනුව සුදුසු ටෙන්ඩර්කරු තෝරා ගත යුතුවේ. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජනනද උත්සව ශාලාව සඳහා 2022 සැප්තැම්බර් 29 දින රු.2,408,963 ක් ගෙවා මිලදී ගෙන සවිකර තිබූ වායු සමීකරණ යන්ත්‍ර 03 ක් විදුලිය ලබා නොගැනීම හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතිණි. | විදුලි මණ්ඩලය සතුව අවශ්‍ය මීටර් හා සවි කිරීමට අවශ්‍ය උපාංග නොමැති වීම නිසා කටයුතු ප්‍රමාද වී ඇති බව. | වත්කම් උපයෝජනයට කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

**වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් අංශය විසින් 2022 වර්ෂයේදී සිදු කරන ලද සමීක්ෂණය අනුව සභාවට අයත් ඉඩම් ලෙස ඉඩම් 101 ක් හඳුනාගෙන තිබුණද ඒවාට අදාළ ඔප්පු ලබාගෙන හෝ මිනුම්කර හෝ නොතිබුණි. | මෙතෙක් අයිතිය තහවුරු කර නොගත් ඉඩම් කිහිපයක් හා කිසිදු තොරතුරක් නොමැති ඉඩම්ද ඇති බව. | සභාවට අයත් ඉඩම් හඳුනා ගෙන ඔප්පු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගිය, මිය ගිය, වැඩ තහනම් කළ හා ස්ථාන මාරු වී ගිය සේවකයින් 163 දෙනෙකුගෙන් රු.15,029,458 ක ණය ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විශ්‍රාම ගිය 72 දෙනෙකුගෙන් රු.7,443,197 ක් විශ්‍රාම වැටුප් දෙපාර්තුමේන්තුවෙන් අයවීමට ඇත. මේවන විට රු.1,454,369 ක් අයවී ඇත. මියගිය නිලධාරීන්ගෙන් රු.222,048 ක් ලැබී ඇත. වැඩ තහනම් කළ නිලධාරීන් 26 කුගේ ඇපකරුවන්ගෙන් මාසික වාරික ලෙස අයවෙමින් පවතී. අදාළ සියළු ණය මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා මූල්‍ය පරිපාලනයට අදාළ ගිණුම් කටයුතු පිළිබඳ නියෝග 08 ප්‍රකාරව පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව පිළියෙල කර එක් එක් මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අනුගාමී මුදල් වර්ෂයන්හි පෙබරවාරි 28 දින හෝ එදිනට පූර්වයෙන් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත දින 14 ක් ප්‍රමාද වී 2023 මාර්තු 14 දින ඉදිරිපත් කර තිබුණි. | ගිණුම් පිළියෙල කළ නිලධාරිනිය සේවය හැර යාම හේතුවෙන් මේ තත්ත්වය ඇති විය. ඉදිරියේදි වාර්ෂික ගිණුම් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කරන බව. | අදාළ දින හෝ ඊට පෙර ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |